# ඇමරිකානු ජනාධිපතිවරණය

මෙවර ඇමරිකානු ජනාධිපතිවරණය නිරීක්ෂනය කිරීමේ අවස්ථාව මට ද ලැබිණි. ඒ ලැබුණේ මා ප්‍රබුද්ධයකු වීම නිසා නො වෙයි. රාජ්‍ය නොවන සංවිධානවල ඊනියා උගතුන්ට හා වෙනත් කසිකබල් ප්‍රබුද්ධයනට මෙන් විදේශවලින් මට මුදල් නො ලැබෙයි. මට මුදල් ලැබුනේ මගේ භාර්යාවට හා ඇගේ සප්තවාර්ෂික නිවාඩුවට පින් සිදුවන්නට ය. නිල වශයෙන් මා ඇමරිකාව නමින් හැඳින්වෙන ඇමරිකා එක්සත් ජනපදයට ගියේ එහි ඔහායෝ ජනපදයේ සින්සිනාටි විශ්ව විද්‍යාලයේ දී විශ්වයේ ත්වරණය පිළිබඳ ව අප විසින් කැලණිය විශ්ව විද්‍යාලයේ කෙරෙන අධ්‍යයනයක ප්‍රතිඵල පාදක කරගෙන සම්මන්ත්‍රණයක් පැවැත්වීමට ය. අවුරුදු හතක පමණ කාලයකට පෙර විශ්වයේ ප්‍රසාරණය නැවතත් ත්වරණයකින් සිදුවන බව බටහිර විශ්වවේදියෝ (කොස්මොලොජිස්ට්ස්) නිරීක්ෂණය කළහ. ඒ සම්බන්ධයෙන් අපේ ඇසින් බලා, සිංහල බෞද්ධ චින්තනයෙහි පදනම් වෙමින් නව ප්‍රවාදයක් ගෙතීමේ, එනම් කතන්දරයක් කීමේ, අවස්ථාව කැලණියේ අපට ලැබිණි. සංවට්ටකප්ප, විවට්ටකප්ප ආධාර කරගනිමින් ගෙතුණු ඒ ප්‍රවාදය ඇමරිකාවේ විශ්වවිද්‍යාලයකට ඉදිරිපත්කිරීමට මට අවස්ථාවක් ලැබුණි.

මගේ නිල කාර්යය එය වුවත් තවත් නිල නොවන කාර්යය ද විය. ඒ අතර ඇමරිකානු ජනාධිපතිවරණය නිරීක්ෂණය කිරීමත් විය. වෙනත් අය විසින් පෙන්වා දී ඇති ආකාරයට ඇමරිකා එක්සත් ජනපදය නම් රට තමන් හැඳින්වීමට යොදාගන්නේ ඇමරිකා මහාද්වීපයේ නම ය. ඉන්දියාවට හෝ චීනයට හෝ ආසියාව යැයි කීම වැනි වරදක් ඇ එ ජනපදයට ඇමරිකාව යැයි කීමේදී සිදුවෙයි. ඒ කෙසේ වෙතත් ලෝකය පාලනය කරන්නෝ ඔවුහු වෙති. එබැවින් අනෙක් අයට ද ඇ එ ජනපදය ඇමරිකාව ලෙස හැඳින්වීමට සිදු වී ඇත.

ඇ එ ජනපද ජනාධිපතිවරණය මා දුටුවේ රූපවාහිනියෙන් හා වෙනත් ජනමාධ්‍යවලින් ය. ජනාධිපතිවරණය පැවැත්වූ දින මගේ පැරණි ශිෂ්‍යයෙක් ඉලිනොයි ජනපදයේ මැතිවරණ චාරිකාවක මා රැගෙන ගියේ ය. මෙවර ජනතාව අතර ජනාධිපතිවරණය පිළිබඳ වෙනදාට වඩා තරමක් උනන්දුවක් තිබිණි යැයි පැවසෙයි. විශේෂයෙන්ම රිපබ්ලිකන් පක්ෂයට ඡන්දය දෙන්නන් අතර උනන්දුවක් විය. ඒ බුෂ් මහතා දිනවීම සඳහා ය. ඔහු මුළු ඡන්දයෙන් සියයට පණස් එකක ප්‍රමාණයක් ලැබී ය. 1988 ට පසුව ජනාධිපතිවරණයක දී ජයගත් අපේක්ෂකයා මුළු ඡන්ද ප්‍රමාණයෙන් බහුතරයක් ලබාගත් ප්‍රථම අවස්ථාව මෙය යැයි පැවසෙයි. ඇ එ ජනපදයේ ජනාධිපතිවරණය පැවැත්වෙන ආකාරය අනුව අපේක්ෂකයකුට මුළු ඡන්දයෙන් බහුතරයක් නොලබා ද ජනාධිපතිවීමේ අවස්ථාව හිමිවෙයි.

ජනාධිපතිවරණයේ ප්‍රධාන ම ප්‍රශ්නය ලෙස ඡන්දදායකයන් දක්වා ඇත්තේ සදාචාරය පිළිබඳ ප්‍රශ්නය ය. දෙවැනි තුන්වැනි ප්‍රශ්න ලෙස දක්වා තිබුණේ ඉරාකය හා ත්‍රස්තවාදය ය. දෙවැන්නත් තුන්වැන්නත් එකම මූලයකින් ගලා එන බැවින් රටේ ආරක්ෂාව ජනාධිපතිවරණයේ ප්‍රධාන ප්‍රශ්නය වූවා නිසැක ය. අද ද ඇ එ ජනපද වැසියෝ සැප්තැම්බර් 11 ගැන කතාකරති. කොටි ප්‍රහාර හා අරන්තලාව හෝ ශ්‍රී මහා බෝධිය හෝ දළදා මාලිගාව හෝ මතක්වන්නේ සිංහලයන්ගෙන් කී දෙනකුට ද? එසේ මතක්වන්නේ ජාතිවාදීන්ට යැයි කීමට ප්‍රබුද්ධයෝ බලා සිටිති. සැප්තැම්බර් 11 ට පසුව ඇ එ ජනපදවාසීන්ට මහත් චිත්තපීඩාවක් ඇති වී තිබෙන බව පැහැදිලි ය. ලෝකයේ පාලක ජාතියේ ආත්මාභිමානයට එල්ල කරන ලද දරුණු පහරක් ලෙස එය ඔවුන්ගේ සිත්හි සදා නොමැකෙන්නක් බවට පත් වී ඇත.

ඇ එ ජනපදය ලෝකයේ බලවත්ම රට පමණක් නො වෙයි. එය ලෝකයේ වඩාත් ම නූතන රට ද වෙයි. නූතනත්වය (මොඩර්නිටි) යනුවෙන් මා නම්කරන්නේ අවුරුදු පන්සියයකට පමණ පෙර යුරෝපයේ ඇති වූ සමාජ තත්ත්වයක් ය. බටහිරයන් කුමක් අදහස් කළද නූතනත්වය යනු අන්කිසිවක් නොව මුළු ලොවම බලහත්කාරයෙන් යුරෝපීයකිරීමේ ක්‍රියාවලිය ය. ඇතැමුන් නොදැන සිටිය ද සංස්කෘතික වශයෙන් එහි දී සිදුවන්නේ ක්‍රිස්තියානිකරණයකි. ආර්ථික වශයෙන් ගත්කල සිදුවන්නේ මුළු ලොවම ධනවාදයට නතුකිරීමක් ය. ධනවාදය යනු නූතනත්වයෙහි ආර්ථික මාතය (මෝඩ්) වෙයි. දේශපාලන වශයෙන් මුළු ලොවම බටහිර ක්‍රිස්තියානි රටවල ආධිපත්‍යයෙහි හා ව්‍යුහතුළ හැසිරවීම ය. මේ සමස්ත නූතනත්වයට එරෙහිව යන ප්‍රධාන දේශපාලන, සංස්කෘතික හා ආර්ථික ක්‍රියාවලිය නම් මුස්ලිම් ව්‍යාපාරය වෙයි. අද ඇ එ ජනපදයට මූලික ප්‍රශ්නය වී ඇත්තේ මේ මුස්ලිම් ව්‍යාපාරය පරාජය කිරීම ය. ඉරාකය, ත්‍රස්තවාදය පමණක් නොව ඊනියා සදාචාර ප්‍රශ්නය ද පසුපස ඇත්තේ ඇ එ ජනපදවාසීන් සිතන ආකාරයට මුස්ලිම් ආක්‍රමණය ය.

© Prof. Nalin De Silva

ඔවුන් සිතන්නේ ක්‍රිස්තියානි ඇගයීම් අද තර්ජනයකට මුහුණ දී ඇති බව ය. ඊනියා මුස්ලිම් ආක්‍රමණය පරාජයකිරීමත් ඇ එ ජනපදය ආරක්‍ෂාකිරීමත් අද ජනපදවාසීන්ගේ එකම ප්‍රශ්නය වී ඇතැයි කිවහොත් එහි වරදක් නැත. කෙටියෙන් කිවහොත් අද ඉරාකය, මුස්ලිම් ත්‍රස්තවාදය ඇ එ ජනපදයේ අභ්‍යන්තර ප්‍රශ්න බවට පත්වී ඇත. එ තවදුරටත් විදේශීය කටයුතු භාර රාජ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රශ්න නො වෙයි.

අප එකක් මතක තබාගත යුතු ය. ඇ එ ජනපදයට ත්‍රස්තවාදය යනු මුස්ලිම් ත්‍රස්තවාදය මිස වෙනත් ත්‍රස්තවාදයක් නො වෙයි. අප බොහෝ දෙනා අමතකකරන කරුණ ද එය වෙයි. බටහිර රටවලට සමස්තයක් ලෙස ගත්කල කොටි සංවිධානය ත්‍රස්තවාදී සංවිධානයක් නො වෙයි. අද එය ඇ එ ජනපදයේ තහනම් කර ඇත්තේ අරන්තලාවේ ඝාතන නිසාවත්, කොළඹ හා අවට බෝම්බ පිපිරවූ නිසාවත් නොව කොටි සංවිධානය ඇතැම් මුස්ලිම් ත්‍රස්තවාදී සංවිධාන සමග සම්බන්ධකම් පවත්වන බැවින් ය. ඇ එ ජනපදය විරුද්ධවන්නේ මුස්ලිම් ත්‍රස්තවාදයට බව අමතක කරන්නා ලංකාවේ දේශපාලනයේ දී වැරදි නිගමනවලට හා තීරණවලට එළඹෙයි.

ඊනියා පශ්චාත්නූතනත්වය ගැන ද වචනයක් කිවයුතු ය. පශ්චාත්නූතනත්වයක් තිබේ නම් එ තිබිය හැක්කේ ඇ එ ජනපදයෙහි ය. එහෙත් එහි ඇති පශ්චාත්නූතනත්වයක් නැත. නූතනත්වය යනු තවමත් විකාශයවන ප්‍රපංචයකි. ඇ එ ජනපදය අඩුම තරමින් අධි නූතන රටක්වත් නො වෙයි. එය ලොවේ වඩාත්ම නූතන රට බවට විවාදයක් නැත. එය තවමත් නූතනත්වයේ චින්තනයෙහි ගැලී සිටියි. මෙවර ජනාධිපතිවරණයෙන් යමක් පෙනෙන්නට ඇත්නම් එ ඇ එ ජනපදයට නූතනත්වයෙන් ඉවත්වීමට සම්ම ජාතියේ නොහැකි බව ය. එ අතර පැහැදිලි තවත් කරුණක් වෙයි, එනම් ඇ එ ජනපදයට කිසි දිනෙක නූතනත්වයේ වර්ධිත අවස්ථාවකටවත් ළඟාවීය නොහැකි බව ය. ඇ එ ජනපදය සමස්තයක් ලෙස ගත්කල ලෝකයේ වඩාත්ම නූතන රට වුව ද නූතනත්වයේ ඇතැම් කරුණු අතින් එරට ඇත්තේ යුරෝපයට පහළින් ය.

නූතනත්වයේ ප්‍රධාන ලක්‍ෂණය වනුයේ පුද්ගලයාට ඇති නිදහස වැඩිකිරීම ය. මේ පුද්ගලයා යනු සංයුක්ත (කොන්ක්‍රීට්) පුද්ගලයකු යැයි නූතනත්වය කීමට තැත්කළ ද මතුවන්නේ වියුක්ත පුද්ගලයෙකි. සංයුක්ත පුද්ගලයාගේ නිදහස වියුක්ත පුද්ගලයකුට පාවා දී ඇත. මැක්ඩොනල්ඩ් සංස්කෘතියෙහි පදනම එය වෙයි. මහා පරිමාණ නිෂ්පාදනය ද අවසානයේ දී සංයුක්තය වියුක්තයට යටකරයි. මේ කරුණ මෙවැනි කෙටි ලිපියකින් විස්තර කළ නො හැකිය. අනෙක් අතට නූතනත්වය එ එ පුද්ගලයාට තම ඉන්ද්‍රිය පිනවීම සඳහා හැකි සෑම ඉඩක් ම ලබාදෙයි. එහෙත් එය ද කළ යුතුවන්නේ අර වියුක්ත පුද්ගලයාට අවශ්‍ය අන්දමට ය. නූතනත්වය සමග ආචාර ධර්ම ද ගිළිහෙන බව ඇ එ ජනපදය තේරුම් ගනිමින් සිටියි. එහෙත් එ තේරුම්ගැනීම සිදුවන්නේ ඊනියා මුස්ලිම් ආක්‍රමණයකට සාපේක්‍ෂව ය.

ජනාධිපතිවරණයේ දී බුෂ් මහතා ජයගන්නා බව මම නොවැම්බර 2 වැනි දා පළ වූ අයිලන්ඩ් පුවත්පතට ලියූ ලිපියක සඳහන් කෙළෙමි. එයට හේතුව ලෝකයේ බලවත්ම ජාතිය ඊනියා මුස්ලිම් ආක්‍රමණය (ව්‍යාප්තිය) පරාජය කිරීම සඳහා කෙරි මහතාට වඩා බුෂ් මහතා සුදුසු යැයි සැලකීම ය. මෙවර ජනාධිපතිවරණයේ දී බලපෑ එකම ප්‍රශ්නය වූයේ රටේ ආරක්‍ෂාව ය. බුෂ් මහතා ජයගැනීමෙන් පසු කළ කතාවෙහි ද රටේ ආරක්‍ෂාව හා ත්‍රස්තවාදය (මුස්ලිම්) පරාජය කිරීම හා සදාචාරය (ක්‍රිස්තියානි) රැකීම අවධාරණය කෙළේ ය. දැනටමත් ෆලූජා ප්‍රදේශය නිදහස් කරගැනීමට යැයි කියමින් ඉරාකයට එරෙහි යුද්ධය නව අදියරකට ගෙන ගොස් ඇත. බුෂ් මහතා වෙනත් කතා මෙන් ම සිය ජයග්‍රාහී කතාව ද අවසන් කෙළේ දෙවියන් වහන්සේ ඔබට ආශිර්වාද කරත්වා, ඇමරිකාවට ආශිර්වාද කරත්වා යනුවෙනි. කුමාරතුංග මහත්මිය මෙන් ඔහු අස්වලාමලේකුම් යැයි නො කීවේ ය. ඔහුගේ කතාවෙන් බෞද්ධයනට, හින්දූන්ට, කොන්ෆියුෂියන්වරුන්ට ආදීන්ට මදි පුංචිකමක් වී දැයි ඇසීමට තරම් ප්‍රබුද්ධයෙක් නො වීය. අවසාන වශයෙන් සඳහන් කළයුතු කරුණු දෙකක් වෙයි. බුෂ් හා කෙරී මහතුන්ට අමතරව ඡන්දදායකයන් දැන සිටියේ නේඩර් නම් අපේක්‍ෂකයකු ගැන පමණ ය. ඔහු සියයට එකක ඡන්දයක් ලබාගත්තේ ය. පසුගිය දා ලංකාවට පැමිණි ඊනියා ලෝක කම්කරු ව්‍යාපාරයේ වැන් මහතා ගැන දැන සිටියෙක් නො වීය. ඔහු ගැන වඩාත්ම දන්නේ සිංහලයන් යැයි සිතමි. දෙවනුව කිවයුත්තේ රිපබ්ලිකන් හා ඩිමොක්‍රටික් අනුගාමිකයන් එ එ අවස්ථාවල ඔල්වරසන් හඬ දුන්නේ තම රටේ ජාතික කොඩිය වැනීමෙන් මිස පක්‍ෂවල පාට ප්‍රදර්ශනය කිරීමෙන් හෝ පක්‍ෂවල කොඩි වැනීමෙන් හෝ නොවන බව ය.

© Prof. Nalin De Silva